# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,720/9 — 1966 නොවැම්බර් 8 වැනි අඟහරුවාදා — 1966.11.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### සුළු නගර සභා ආඥපනත සහ ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 10 වැනි වගන්තියෙන් සහ (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

M. TIRUCHELVAM,
පළාත් පාලන ඇමති.

1966 නොවැම්බර් මස 8 දින,
කොළඹ දී ය.

ආඥාව

1. හිඟුරක්ගොඩ සුළු නගර සභාවේ දැනට නිලයේ සිටින සභිකයන්ගේ නිල කාලය අවසාන විය යුතු දිනය වශයෙන් 1966 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට 1967 ජූනි 30 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

2. ඉහත කී සුළු නගර සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම පිණිස 1966 දෙසැම්බර් තිස්එක් වැනි දින හෝ ඊට ප්‍රථම මහා ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්‍ය්‍යය සඳහා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩලය ඡන්ද විමසීම් ආඥපනත යටතේ මෙතෙක් කරන ලද සියලුම කටයුතු අවලංගු හා බල රහිත විය යුතුවාක් මෙන්ම සියලු අවස්ථාවන්හිදී එසේ අවලංගු හා බල රහිත වී ඇතැයි ද සැලකිය යුතුය.

3. ඉහත කී සුළු නගර සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම පිණිස 1966 දෙසැම්බර් මස තිස්එක් වැනි දින හෝ ඊට ප්‍රථම මහා ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්‍ය්‍යය සඳහා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත යටතේ තවදුරටත් ක්‍රියා නොකළ යුතුය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

806/1— ආර් ආර් 18906—5,200 (66/11)